# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/15/11 | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.03. 29 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ඉංජිනේරු සේවා),
සියලු ම දෙපාර්තමේන්තු ප්‍රධානීන් /ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>රාජ්‍ය ආයතන සඳහා බලශක්ති කළමනාකරණ හා පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳ විද්‍යුත් තාක්ෂණය හරහා කෙරෙන වැඩමුළුව(online programme).</u>**

උක්ත මැයෙන් යුතු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SLSEA2022/DSM/ISS01/PRO2/01 හා 2022 මාර්තු 07 දිනැති ලිපිය හා බැඳේ. (එහි පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.)

02. එම ලිපියෙහි දක්වා ඇති ලෙස ජනාධිපති ලේකම්ගේ 2019 මාර්තු 28 දිනැති අංක PS/PCMD/C/13/2019 දරණ චක්‍රලේඛය අනුව **සියලු ම රාජ්‍ය ආයතන බලශක්ති කළමනාකරණ නිලධාරියෙකු පත් කළ යුතු අතර එම නිලධාරියා විසින් සෑම කාර්තුවක් අවසානයේ දීම තම ආයතනයේ බලශක්ති පරිභෝජන දත්ත ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත එවිය යුතු වේ.** තව ද විද්‍යුත් තාක්ෂණය හරහා කෙරෙන වැඩමුළුව(online programme) සඳහා එම ලිපියෙහි සඳහන් කර ඇති පරිදි අදාල නිලධාරීන් සහභාගි කරවන ලෙසත් දන්වා ඇත.

03. ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණික ව දන්වා සිටින අතර මේ පිළිබඳ යම් පැහැදිලි කර ගැනීමක් හෝ බලශක්ති සංරක්ෂණය සම්බන්ධ ව යම් ගැටළුවක් පවතී නම් **<u>www.energy.gov.lk</u>** වෙබ් අඩවියෙන් වැඩි විස්තර ලබා ගන්නා ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

**ආර්. සී. ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - කාරු. දැ. ගැ. ස.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு சக்தி அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority

සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යවස්ථාපිත අධිකාරියකි
சூரியசக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்தி கருத்திட்ட இராஜாங்க அமைச்சின் நியதிச்சட்ட அதிகார சபை
A Statutory Authority of State Ministry of Solar, Wind and Hydro Power Generation Projects Development

මගේ අංකය : SLSEA2022/DSM/ISS01/PR02/01

2022 මාර්තු 07

ආර්.සී. ද සොයිසා මහතා
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
එස්.එච්.දහනායක මාවත, ගාල්ල

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි,

**රාජ්‍ය ආයතන සඳහා බලශක්ති කළමණාකරණ හා පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳ විද්‍යුත් තාක්ෂණය හරහා කෙරෙන වැඩමුළුව (online programme)**

බලශක්ති සංරක්ෂණය, කාර්යක්ෂමතා භාවිතය හා පුනර්ජනනීය බලශක්තීන් ප්‍රවර්ධනය හා භාවිතයට ගැනීම රටේ ජාතික අවශ්‍යතාවයක් ලෙස වර්තමාන රජය හඳුනාගෙන තිබේ. මේ වන විට ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිර යන කොරෝනා වයිරස් ව්‍යසනයත් සමග ඇති වී තිබෙන ආර්ථික අර්බුදයට මුහුණදීමට ශ්‍රී ලංකාවටද සිදුවී ඇති අතර බලශක්ති අර්බුදයද එහිලා ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ වෙනුවෙන් ජාතික මට්ටමින් රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට පවරා ඇති අතර මේ වන විටත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් රාජ්‍ය අංශ, පුද්ගලික අංශ, වාණිජ හා කර්මාන්ත අංශ, පාසල් හා විශ්වවිද්‍යාල කේන්ද්‍රකොට ගනිමින් විවිධ වැඩසටහන් දියත්කොට ඇත. ගෘහස්ත විදුලි උපකරණ සඳහා බලශක්ති ලේබල් හඳුන්වා දීමේ වැඩසටහන, බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සංග්‍රහය හඳුන්වාදීම, බලශක්ති පිල් ලකුණු ස්ථාපිත කිරීම, සූර්ය බල සංග්‍රාම වැඩසටහන, බලශක්ති කළමනාකරු වැඩසටහන, ජාතික බලශක්ති සම්මාන ප්‍රදානය ආදිය ඒ අතර ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම එහි එක් පියවරක් ලෙස රාජ්‍ය ආයතන වල බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් ජනාධිපති ලේකම්තුමා හරහා 2019 මාර්තු 28 දිනැති අංක PS/PCMD/C/13/2019 දරණ චක්‍රලේඛය නිකුත් කරන ලදී.

එම චක්‍රලේඛයට අනුව සියලුම රාජ්‍ය ආයතන බලශක්ති කළමනාකරණ නිලධාරියෙකු පත්කළ යුතු අතර එම නිලධාරියා තම ආයතනයෙහි බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා මැදිහත් විය යුතුය. එමෙන්ම එම බලශක්ති කළමනාකරණ නිලධාරියා විසින් සෑම කාර්තුවක් අවසානයේදීම තම ආයතනයේ බලශක්ති පරිභෝජන දත්ත ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත එවිය යුතුවේ.

එනමුත් ඇතැම් රාජ්‍ය ආයතන මේ පිළිබඳව තවමත් නිසි දැනුවත්භාවයකින් කටයුතු නොකරන බව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලැබෙන බලශක්ති පරිභෝජන දත්ත ඉතා අවම මට්ටමක පැවතීමෙන් අපට පෙනී ගොස් ඇත. එමෙන්ම අප ආයතනය සමග සක්‍රීයව සම්බන්ධ වන බලශක්ති කළමනාකරණ නිලධාරීන්ගේ සංඛ්‍යාවද ඉතා අවම මට්ටමක පවතී.

නො: 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
இல: 72, ஆனந்தகுமார சுவாமி மாவத்தை, கொழும்பு 07, இலங்கை.
No: 72, Ananda Coomaraswamy Mawatha, Colombo 07, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office | දුරලිපිවනය / தொலைநகல் / Facsimile | විද්‍යුත්තැපෑල / மின்னஞ்சல் / E- mail | වෙබ් අඩවිය / இணையம் / Web Site

එම නිසා රට තුල සියළුම රාජ්‍ය ආයතන මෙම වැඩසටහනට අනුගත කිරීම සඳහා පළාත් සභා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති සියළුම රාජ්‍ය ආයතනත් අනෙකුත් සියලුම රාජ්‍ය ආයතනත් සම්බන්ධ කර ගනිමින් මෙම වැඩසටහන වඩාත් සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සැලසුම් කොට ඇත.

ඒ අනුව ඉදිරියේදී රාජ්‍ය ආයතනවලින් ලබාගන්නා බලශක්ති දත්ත උපයෝගී කරගනිමින් රාජ්‍ය ආයතන සඳහා බලශක්ති පිල් ලකුණු හඳුන්වාදීම මගින් එම ආයතනවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කෙරෙනු ලැබේ. මේ වනවිටත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් බලශක්ති පිල් ලකුණු සම්බන්ධ රෙගුලාසියක් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා ඇත.

මේ හා සමගාමීව වත්මන් බලශක්ති අර්බුදයට පිළියම් ලෙස, බලශක්ති කළමනාකරණය හා පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳ රාජ්‍ය ආයතන හා රාජ්‍ය ආයතනයන්හී පත් කරනු ලැබූ බලශක්ති කළමනාකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමටද සැලසුම් කොට ඇත.

නමුත් ඇතිවී තිබෙන වර්තමාන තත්වය හමුවේ එක් ස්ථානයකට රැස්වී වැඩමුළු පැවැත්වීම සෞඛ්‍ය ආරක්ෂිත නොවන බැවින් විද්‍යුත් තාක්ෂණය භාවිතයෙන් කෙරෙන වැඩමුළු (online programmes) 2022 මාර්තු මාසයේදී පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. එබැවින් ඒ සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු නම්කර අප වෙත සම්බන්ධ කර දෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි. එමෙන්ම එම වැඩසටහන සඳහා ඔබ පළාත් සභාව තුල රාජ්‍ය ආයතනයන්හී ප්‍රධානීන් හෝ ප්‍රධානියා නියෝජනය වන නිලධාරියෙකු හා පත් කරනු ලැබූ බලශක්ති කළමනාකරණ නිලධාරියා සහභාගී කරවන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි. තවද මේ වන විටත් බලශක්ති කළමනාකරණ නිලධාරියෙකු පත් නොකළ ආයතනයක් වේ නම් ඒ වෙනුවෙන් සුදුසු නිලධාරියෙකු පත් කර වැඩසටහන සඳහා සහභාගී කරවන මෙන්ද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී

සුලක්ෂණා ජයවර්ධන
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

පිටපත්: ලේකම්, විදුලිබල අමාත්‍යාංශය(දකුණු පළාත)